# කොළඹ විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව
# නීති පීඨය

## නීතිවේදී උපාධි පරීක්ෂණය, 3 වසර 2017
## අන්තර්ජාතික මානුෂවාදී නීතිය

(පැය තුනයි)

මුළු ප්‍රශ්න සංඛ්‍යාව: 07 (හතයි)

ඕනෑ ම ප්‍රශ්න **හතරකට පමණක්** පිළිතුරු සපයන්න.

(නොපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කෙරේ .)

1. "මීට වසර කිහිපයකට පෙර අන්තර්ජාතික මානුෂවාදී නීතිය පොදු අන්තර්ජාතික නීතියෙහි නව්‍ය සහ වැදගත් අංගයක් වුව ද, වර්තමාන ලොව තුල සිදු වන අවි ගැටුම් වල ස්වභාවය වේගවත් වෙනස්වීම් වලට බඳුන් වීම, තාක්ෂණික දියුණුව හෝ යුද්ධය හේතුවෙන් හටගන්නා දුක් පීඩා අවම කිරීම සඳහා අවශ්‍ය වන අන්තර්ජාතික සහයෝගීතා ව්‍යුහයන් සහ විනාශකාරී ආයුධ පහසුවෙන් ලබා ගැනීමේ හැකියාව වැනි ගැටළුවලට සාර්ථකව මුහුණ දීමට නොහැකි වීම නිසා මෙම නීතිය දැනටමත් යල්පැන ගොස් ඇත."

ඉහත ප්‍රකාශයේ දක්වා ඇති 21වන සියවසේ අභියෝගයන්ට විශේෂ අවධානය යොමු කරමින් ද, අන්තර්ජාතික මානුෂවාදී නීතිය තුළ 20වන සියවසේ සිදුවූ වර්ධනයන් දක්වමින් ද, ඔබගේ පිළිතුර සනාථ කිරීමට අදාළ නිදසුන් භාවිතා කරමින් ඉහත ප්‍රකාශය විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

2. පහත දැක්වෙන අවස්ථාවන් ඔබ සිතන අයුරින් වර්ගීකරණය කළ හැක්කේ කෙසේ ද යන්න සහ එම අවස්ථාවන් ජිනීවා සම්මුතීන්ට හා / හෝ ඒවායේ අතිරේක ප්‍රොටෝකෝලයන් වල විෂය පථයන් යටතට අයත් වන්නේ ද යන්න සම්බන්ධයෙන් තර්කානුකූල අදහස් ඉදිරිපත් කරමින් සාකච්ඡා කරන්න:

අ. "සහරියා රාජ්‍යය" තුළ වෙසෙන අසූර් සහ ඕකර් වැසියන් අතර පවතින අභ්‍යන්තර වාර්ගික ආතතීන් පිළිබඳව ඉතා දිගු ඉතිහාසයක් ඇත. සහරියා රාජ්‍යයේ ආණ්ඩුව සහ පරිපාලන ක්‍රමය තුළ වැඩි වශයෙන් සිටින්නේ අසූර් නිලධාරීන්ය. වාර්ගික වෙනස්කම් හේතුවෙන් වර්ධනය වන සිවිල් නොසන්සුන්තාවයෙන් අගතියට පත් වන ඕකර් ජනයාගේ අයිතීන් ආරක්ෂා කිරීම සඳහා 2017 දී බටහිර කලාපය තුළ "ඕකර් නිදහස" නමැති සංවිධානය පිහිටුවා ඇත. බටහිර කලාපය තුළින් ආරම්භ කර, රට පුරා ව්‍යාප්ත වන පරිදි ප්‍රචණ්ඩත්වය පතුරුවමින් දේපල කොල්ලකෑම් සහ පුළුස්සා දැමීම් සිදු කරන සන්නද්ධ කණ්ඩායම් ඇති බව දක්නට ලැබේ. "ඕකර් නිදහස" මෙම ක්‍රියාවන්ට වගකිව යුතු බව පවසමින් එම තත්ත්වය පාලනය කිරීම සඳහා දේශීය බලධාරීන් විසින් සහරියා හමුදා භට පිරිස් ද, යුද්ධ ටැංකි සහ හෙලිකොප්ටර් යානා ද බටහිර කලාපයට යවනු ලබයි. අන්තර්ජාතික මානුෂවාදී නීතියේ අදාළත්වය පිළිබඳව ජාත්‍යන්තර ප්‍රජාව අදහස් පළ කල ද, සහරියා රාජ්‍යය විසින් පවසනු ලබන්නේ මෙම අභ්‍යන්තර කටයුත්තට අන්තර්ජාතික මානුෂවාදී නීතිය අදාළ නොවන බවයි.

ආ. අයිරෝලා සහ දියන්ලන්තය යනු අසල්වැසි රටවල්ය. දියන්ලන්තයේ ජනවාර්ගික කණ්ඩායම් දෙකක් අතර මෑතකදී සිවිල් යුද තත්ත්වයක් හටගෙන ඇත. සිවිල් යුද තත්ත්වයේ දී රජයට සහයෝගය දැක්වීම සඳහා අයිරෝලා විසින් දියන්ලන්තයට හට පිරිස් ඒවා ඇති බව එක් උදෑසනකදී දියන්ලන්ත වැසියන්ට හදිසියේ දැනගන්නට ලැබී ඇත. අයිරෝලා හි මැදිහත්වීමක් ලෙස මෙය දැකීමෙන් කෝපයට පත් බොහෝ දියන්ලන්ත පුරවැසියන් සිවිල් යුද්ධයේ කුමන පාර්ශවයක් උදෙසා සටන් කරන්නේ ද යන වග පසෙක ලා අයිරෝලා හමුදාවට එරෙහිව ප්‍රහාර එල්ල කරනු ලබයි.

ඇ. සාප්පු සංකීර්ණයක සහ දුම්රිය ස්ථානයක සිටි මේ රටේ සිවිල් වැසියන් ඉලක්ක කොට ගෙන කලින් අවස්ථාවක බෝම්බ ප්‍රහාරයක් එල්ල කිරීම සඳහා "ටසින්" විසින් "ශින්ටන්" වෙත සන්නද්ධ කණ්ඩායම් එවූ බව කියමින් ශින්ටන් රාජ්‍යය විසින් ටසින් රාජ්‍යය ආක්‍රමණය කර ඇත. ටසින් රාජ්‍යයේ පුරවැසියන් ආයුධ සන්නද්ධව, මරාගෙන මැරෙන ප්‍රහාර එල්ල කිරීම් ද ඇතුළු සියලු ක්‍රමවේදයන් භාවිතා කරමින්, ආක්‍රමණික හමුදා සමඟ සටන් කිරීමට තම ආණ්ඩුවට ආධාර දෙති. ශින්ටන් හමුදාවේ "ජෙනරාල් ඩී" විසින් පවසා සිටින්නේ ඔවුන්ට ප්‍රහාර එල්ල කරන ටසින් වැසියන් නීති විරෝධී ක්‍රමවේදයන් භාවිතා කරනා ත්‍රස්තවාදීන් බැවින් ඔවුන්ට ජිනීවා සම්මුතීන්වල සහ ඒවායේ අතිරේක ප්‍රොටොකෝල වල අන්තර්ගත රැකවරණයන් අදාළ නොවන බවයි.

3. "අන්තර්ජාතික මානුෂවාදී නීතිය විසින් ඇතැම් ආයුධ තහනම් කිරීම, ආයුධ භාවිතය හා නිෂ්පාදනය කිරීම සීමා කරනු ලබන්නේ මිනිසුන්ට සිදුවන අනවශ්‍ය පීඩාවන් වැලැක්වීම සඳහා පමණි. මෙම නීතිය තුළ ස්වාභාවික පරිසරයේ වැදගත්කම රඳා පවතින්නේ මානව වර්ගයාට අදාළව මිස පරිසරය වෙනුවෙන් ම නොවේ. ස්වභාවික පරිසරය සුරක්ෂිත කිරීම පරිසර නීතිය මගින් ආවරණය වන අතර එය සුරක්ෂිත කිරීම අන්තර්ජාතික මානුෂවාදී නීතියේ අරමුණක් නොවේ."

විවිධ වර්ගයේ ආයුධ භාවිතය කෙරෙහි අන්තර්ජාතික මානුෂවාදී නීතිය මගින් පනවා ඇති නෛතික සීමාවන් දක්වමින් ඉහත ප්‍රකාශය විවේචනාත්මකව අගයන්න.

4. "සාලි රාජ්‍යයේ" පිහිටා ඇති "ටාඕ" නමින් හැඳින්වෙන පුරාණ පූජනීය නගරය "යාන" නමැති ආගමට අයත් විහාරස්ථාන රාශියකින් සමන්විත වන අතර පූජනීය අත්පිටපත් දහස් ගණනක් ඇති වර්ෂ දහසකට වඩා පැරණි පුස්තකාලයක් ද මෙහි පිහිටා ඇත. ටාඕ නගරය පිළිබඳව සාලි රාජ්‍යය මහත් අභිමානයෙන් පසුවන අතර එහි අගය වටහාගෙන එය ආරක්ෂා කිරීම උදෙසා ඔවුන් සියලු ම අන්තර්ජාතික නීතිමය පියවර ගෙන ඇත. අසල්වැසි "හිලීලන්ත රාජ්‍යය" සමඟ පැවති සන්නද්ධ ගැටුමේදී හිලීලන්තය විසින් ටාඕ නගරය අත්පත් කරගෙන ඇත. හිලීලන්ත නිලධාරියෙකු වන වලඩ් මහතාව ටාඕ නගරයේ පරිපාලක ලෙස පත් කර ඇත. හිලීලන්තයේ ප්‍රධාන පූජකයා පවසා සිටින්නේ යාන ආගම මගින් කලාපය තුළ වැරදි චින්තනයක් පතුරුවමින් සිටින බැවින් එය නවතාලිය යුතු බවයි. පසුව සාලි රාජ්‍යයේ හමුදාවන් විසින් මෙම භූමිය හිලීලන්තයෙන් මුදා ගත් අතර වලඩ් මහතා සහ තවත් හිලීලන්ත සොල්දාදුවන්ව තම ග්‍රහණයට ගන්නා ලදී. අත්පත් කරගත් හමුදා විසින් ඉහත දැක්වූ විහාරස්ථානවලට සහ පුස්තකාලයට දැඩි අලාභ හානි සිදු කර ඇති බව පසුව දැනගන්නට ලැබුණි.

මෙම ක්‍රියාවන් සැබවින් ම ක්‍රියාවට .නැංවූයේ හිලීලන්ත සොල්දාදුවන් වුව ද ටාඕ නගරවැසියන් පවසා සිටිනුයේ මෙම විනාශයට වැඩි වශයෙන් ම වගකිව යුත්තේ වලඩ්

මහතා බවයි. මොවුන් තවදුරටත් පවසා සිටින්නේ එලඩ් මහතා විසින් පෞද්ගලිකව ඇතැම් පූජනීය අත්පිටපත් ගෙන හිලීලන්තයට ආයුධ මිලදී ගැනීම සඳහා අවශ්‍ය වන මුදල් සම්පාදනය කරගැනීමට ඒවා විදේශීය ගැනුම්කරුවන්ට විකුණා ඇති බවයි. එලඩ් මහතාගේ ප්‍රතිචාරය වූයේ ඔහු කිසි පුද්ගලයෙකුට තුවාල සිදු කර නොමැති බවත්, ඝාතන කර නැති බවත්, ඔහු සිවිල් වැසියෙකු බැවින් සොල්දාදුවන්ට අණදීම් නොකළ බවත් මෙන් ම ඔහු විකුණූ දේපල එම අවස්ථාවේදී හිලීලන්තයට අයත්ව තිබුණු බැවින් ඔහු විසින් කිසිදු අපරාධයක් කර නොමැති බවත්ය.

පූජනීය නගරයට සිදු කර ඇති හානිය හේතුවෙන් එලඩ් මහතාට අන්තර්ජාතික නීතිය යටතේ දඬුවම් පැමිණවීමට සාලි රාජ්‍යයට අවශ්‍යව ඇත. අදාළ අවස්ථාවලදී නඩු තීන්දු, නීතිමය ප්‍රතිපාදනයන් හා සම්මුති නීති ප්‍රතිපාදන උපුටා දක්වමින් සාලි රාජ්‍යයට අදාළ නීතිය පිළිබඳව උපදෙස් දෙන්න.

5. "ඔරෝස්" හා "නූලා" යනු දේශ සීමාවන් වලින් යාව ඇති රාජ්‍යයන් දෙකකි. නූලාහි ආයුධ ගබඩාවක් ලෙස හඳුනා ගැනුණු ස්ථානයකට 2016 දී ඔරෝස් විසින් ගුවන් ප්‍රහාරයක් එල්ල කරන ලදී. පසුව හෙළිදරව් වූයේ බුද්ධිමය වාර්තාව වැරදී ඇති බවත් සත්‍ය වශයෙන් ම ප්‍රහාරය එල්ල කර තිබුනේ පොත් ගබඩාවකට බවත්ය. මෙයට පළිගැනීමක් ලෙස නූලා විසින් ඔරෝස්හි මධ්‍යම විදුලිබල මණ්ඩලයට (ම.වි.ම.) ප්‍රහාරයක් එල්ල කරන ලදී. මෙම ප්‍රහාරය සාධාරණීකරණය කරමින් නූලා විසින් ප්‍රකාශ කරන ලද්දේ ම.වි.ම. විසින් සපයන විදුලිබලය ඔරෝස් සන්නද්ධ හමුදාවන් විසින් භාවිතා කරන බවයි. එනමුත්, ප්‍රහාරයට පසුදින ඔරෝස්හි පුවත්පත් වල වාර්තා කර තිබුනේ විදුලිබලය විසන්ධි වීම නිසා සාමාන්‍ය ජන ජීවිතය අඩාල වී ඇති බවකි.

නූලා හමුදාවේ යුධ හමුදාපති පීටර් ඝාතනය කිරීමට අපේක්ෂා කරමින් ඔරෝස් විසින් 2017 ජූලි මස ප්‍රහාරයක් එල්ල කරන ලදී. මෙම ප්‍රහාරය දියත් කරන ලද්දේ, "හොටෙල් හෝප්" නමැති ස්ථානයේ පැවති යුධ හමුදා සම්මේලනයකට පීටර් සහභාගී වෙමින් සිටි අවස්ථාවකදීය. එම අවස්ථාවේදීම මෙම හෝටලය තුළ  සමාගමක වාර්ෂික උත්සවයක් ද පැවැත්වෙමින් තිබුණි. මෙම ප්‍රහාරය හේතුවෙන් නූලා හමුදාවේ ජ්‍යෙෂ්ඨ අණදෙන නිලධාරීන් පස් දෙනෙකු  (05) ද, සිවිල් වැසියන් තිස් දෙනෙකු (30) ද මරණයට පත් වුව ද, පීටර් සුළු තුවාල වලට ලක්ව දිවි ගලවා ගත්තේය. යුදමය වාසියක් මෙයින් අත්වූ බව පවසමින් මෙම ප්‍රහාරය සාධාරණීකරණය කරන නිල ප්‍රකාශයක් ඔරෝස් විසින් නිකුත් කර ඇත.

මෙම රාජ්‍යයන් දෙක ම ජිනීවා සම්මුතීන්ට හා ඒවායේ අතිරේක ප්‍රොටොකෝලයන්ට පාර්ශවකරුවන් වන බව සලකමින් දී ඇති දත්ත වලින් පැන නඟින් නෛතික ගැටළු විශ්ලේෂණය කරන්න. ඔබගේ පිළිතුර නෛතික අධිකාරීන් භාවිතා කරමින් සනාථ කළ යුතුය.

6. පසුගිය වර්ෂ කිහිපය තුළ ට්‍රොපිකා රාජ්‍යය සන්නද්ධ ගැටුම් හේතුවෙන් විනාශයට පත්ව ඇත. බහුතර ප්‍රජාව වන "ඇල්පොස්" සහ සුළුතර ප්‍රජාව වන "බිස්කෝස්" අතර පවතින බල අරගලය නිසා බිස්කෝස් ප්‍රජාව විසින් ඔවුන් සඳහා වෙන්වූ රාජ්‍යයක් පිහිටුවා ගැනීමේ අරමුණෙන් ට්‍රොපිකාහි සන්නද්ධ හමුදාවන්ට එරෙහිව ප්‍රහාරයක් එල්ල කර ඇත.

2015 දී බිස්කෝස් ප්‍රජාව විසින් "බිස්කෝස් හමුදාවේ" ප්‍රධානියා ලෙස "රොබී" ව පත්කරගන්නා ලදී. බිස්කෝස් හමුදාවට දියුණු ආයුධ ද, නිල ඇඳුම් ද හඳුන්වා දුන් රොබී, බිස්කෝස් හමුදාවේ විවිධ පැතිකඩවල් මෙහෙයවීම සඳහා නියෝජ්‍ය නායකවරු පස් දෙනෙකු ද පත් කළේය. සාර්ථකව මෙහෙයවන ලද ප්‍රචාරක ව්‍යාපාර හේතුවෙන් තරුණ පුරුෂයන් හා කාන්තාවන් ද බිස්කෝස් හමුදාව සමඟ ම ට්‍රොපිකා හමුදාවට එරෙහිව සටන්

කිරීම සඳහා පොළඹවා ගැනීමට බිස්කෝස් හමුදාව සමත්වී ඇත. මාස තුනකට පෙර ට්‍රොපිකා හමුදාවන් විසින් මෙයින් ඇතැම් පුද්ගලයන්ට, ඔවුන් තම ගොවිපලවල්වල වැඩකරමින් සිටියදී ම, ප්‍රහාර එල්ල කරන ලදී. මින් පුද්ගලයන් දස දෙනෙකු අත්අඩංගුවට ගෙන, බිස්කෝස් හමුදාවේ සාමාජිකයන් කිහිප දෙනෙකු ද වසරකට අධික කාලයක් තිස්සේ රඳවා ගෙන සිටින "විශේෂ ස්ථානයක" ඔවුන්ව රඳවනු ලැබ ඇත. මෙම පුද්ගලයන්ට හා බිස්කෝස් හමුදාවේ රැඳවියන්ට තම පවුල්, නීතිඥයන්, හෝ ජාත්‍යන්තර රතු කුරුස සංගමයේ නිලධාරීන් සමඟ සන්නිවේදනය කිරීමට අවසර ලබා දී නැත. "අන්තර්ජාතික අයිතිවාසිකම් මුරකාය" නමින් හැඳින්වෙන සංවිධානය විසින් වාර්තා කර ඇත්තේ මෙසේ රඳවා තබාගෙන ඇති ඇතැම් රැඳවියන්ගෙන් බලහත්කාරයෙන් දැඩි වශයෙන් වෙහෙසකර ශාරීරික බර වැඩ ලබා ගන්නා බවයි.

ජිනීවා සම්මුතීන් හතරට සහ ඒවායේ අතිරේක ප්‍රොටොකෝලවලට ට්‍රොපිකා රාජ්‍යය පාර්ශවකරුවෙක් වේ. ඔබ ට්‍රොපිකා විශ්ව විද්‍යාලයේ නෛතික පර්යේෂකයෙකු යැයි ද, විස්තර කරන ලද සිද්ධීන් පිළිබඳව නෛතික විශ්ලේෂණයක් සිදු කිරීම ඔබගෙන් බලාපොරොත්තු වන්නේයැයි ද සිතා අදාළ නෛතික ප්‍රතිපාදනයන් සහ නඩු තීන්දු උපුටා දක්වමින් වාර්තාවක් ලියා දක්වන්න.

7. "සෞම්‍යා" හා "රම්‍යා" යනු අසල්වාසී රාජ්‍යයන් දෙකක් වන අතර සෞම්‍යාහි භූමියට රම්‍යාහි අධි තාක්ෂණික ආයුධ පර්යේෂණාගාරය විසින් විකිරණශීලී අපද්‍රව්‍ය මුදා හැරීම හේතුකොටගෙන දෙරට අතර දේශ සීමා ආරවුල් උග්‍ර අතට හැරී සම්පූර්ණ ආයුධ සන්නද්ධ ගැටුම් පැන නැගී ඇත. ගැටුම්හි නිරත පාර්ශවයන්හි ප්‍රචණ්ඩ ක්‍රියා වලට පහත දැක්වෙන දේ අයත්ය:

අ. රම්‍යා හමුදාවන් විසින් විෂ හා රසායනික ආයුධ භාවිතා කරමින් සෞම්‍යාහි ජාතික වස්තුවක් සේ සැලකෙන උද්භිද උද්‍යානය සම්පූර්ණයෙන් ම විනාශ කර ඇත.

ආ. එයට පළිගැනීමක් ලෙස අධික ජනගහණයකින් යුත් රම්‍යාහි තිබෙන ගම්මානයක් වන "ලේපෝ"හි පිහිටි අධි තාක්ෂණික පර්යේෂණාගාර වලට මිනිසුන් රහිත ගුවන් යානා හා විශාල කාලතුවක්කු භාවිතා කරමින් සෞම්‍යා විසින් එල්ල කරන ලද ප්‍රහාරය හේතුවෙන් මෙම ස්ථානයේ සේවයේ නියුතුව සිටි සිවිල් කාර්ය මණ්ඩලය මරණයට පත්ව ඇත.

ඇ. රම්‍යාහි බුද්ධි අංශය විසින් සෞම්‍යාහි භූමියට ප්‍රහාරයක් එල්ල කිරීමට දක්ෂයන් පිරිසක් යවනු ලබන්නේ ඔවුන් ග්‍රහණයට නතුවුවහොත් දිවි නසා ගන්නා ලෙස හෝ මානවවාදී සේවකයන් ලෙස වංචනික පෙනී සිටින ලෙස උපදෙස් සපයමිනි.

සෞම්‍යා හා රම්‍යා යන රාජ්‍යයන් දෙක ම, 1949 ජිනීවා සම්මුතීන්ට ද, 1977 පළමු අතිරේක ප්‍රොටෝකෝලයට ද පාර්ශවකරුවන් වන බව උපකල්පනය කරමින් දෙපාර්ශවයේම අයිතිවාසිකම් හා වගකීම් පිළිබඳව සාකච්ඡා කරන්න.

*   *   *